# මහපොතාන කෝරළයේ අස්පෘෂ සංස්කෘතික උරුමය පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යනයක්

කේ.එම්.යූ.කේ. ජයසේකර

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
umayangakumari@gmail.com

ප්‍රමුඛ පදඃ අස්පෘෂ, පුද පූජා, උරුමය, පාරම්පරික, දෙවියන්

## හැඳින්වීම

විවිධ අරමුණු මුල් කර ගනිමින් දේව, යක්ෂ, නාග, ආදීන්ට පුද පූජා පැවැත්වීම ආරම්භ වන්නේ මෑතක දී නොවේ. ප්‍රාග් ඓතිහාසික යුග වලදී මිනිසා යම් යම් හේතු කාරණාවන් උදෙසා දෙවියන්, යක්ෂයින්, පිදීම සිදු කිරීමත් ඒ සඳහා විවිධ පුද පූජා පැවැත්වීමත් ආරම්භ විය. මුල් කාලීනව පැවති සංචාරක ජීවන ක්‍රමය තුළ ඇති වන අභියෝග හමුවේ එනම් වන සතුන්ගෙන් , ස්භාවික විපත් වලින්, ලෙඩ රෝග වලින්, ආරක්ෂා වීම සඳහා පවත්වනු ලැබූ අභිචාර විධි කල් යත්ම සශ්‍රිකත්වය, සෞභාග්‍ය අරමුණු කරගෙන ද ලෞකික ජීවිතයේ විවිධ ආශාවන් ඉෂ්ට කර ගැනීම සඳහා ද පවත්වන්නට පුරුදු වී ඇත. මිනිසා ක්‍රමයෙන් පරිණාමයට පත්වත්ම ඔහුගේ මනස ද දියුණු විය. මිනිස් ශ්‍රමයෙන් ගින්දර සොයා ගැනීම, නිවාස තනා ගැනීම, කෘෂිකර්මාන්තය ආදීයට හුරු වීම මෙන්ම ගංගා මිටියාවත් වල තම ජනාවාස කරනය සිදු කරමින් ශිෂ්ටාචාරවත් විය. ඒත් සමගම ඔවුන් පෙර පැවති නොදියුණු ක්‍රියා වලින් ඉවත් වූ නමුත් ඔවුන් විසින් පවත්වාගෙන ආ මෙමම පුද පූජා අංග තව දුරටත් දියුණු වූ අතර අද වන විට මේවා උත්සවාකාරයෙන් පවත්වනු ලබයි.

මහපොතාන කෝරළය පර්යේෂණය සඳහා තෝරා ගැනීමට හේතු වූයේ සාම්ප්‍රධායික අස්පෘෂ උරුමයන් අධ්‍යනය කිරීමෙහිලා මෙම ප්‍රදේශය තෝතැන්නක් බඳුය. එමෙන් ම පුරාවිද්‍යාත්මක මෙන් ම ඓතිහාසික වැදගත්කම් වලින් ද යුක්ත වේ. අතීතයේ සිට ම පැවත එන සාම්ප්‍රධායික කුල ක්‍රමය මත පදනනම් වූ පුද පූජා වර්තමානය වන විට උත්සවාකාරයෙන් පවත්වනු ලබයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ මහපොතාන කෝරළයට ආවේණික අස්පෘෂ සංස්කෘතික උරුමය හඳුනාගැනීමයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දී තවත් උප අරමුණු කිහිපයක් ඇත. මේවායේ ආරම්භය හා කුල ක්‍රමය සමග ඇති සම්බන්ධතාවය හඳුනාගැනීම, වර්තමානය වන විට මෙමම උත්සව පැවැත්වීමෙහිලා ඇති අභියෝග හඳුනා ගැනීම, මෙමම අභිචාර පැවැත්වීම තුළින් ඔවුන්ගේ අභිප්‍රායන් ඉටුවේද යන්න සොයා බැලීම එම උප අරමුණු වේ. මහපොතාන කෝරළයට ආවේණික අස්පෘෂ සංස්කෘතික උරුමය හා ඒවායේ ප්‍රාදේශීය සුවිශේෂිත්වයන් මොනවාද? යන පර්යේෂණ ගැටළුවට අනුව මෙමම පර්යේෂණය දියත් විය.

## ක්‍රමවේදය

පුරාණ පරිපාලන බෙදීම් වලට හා සිංහල පාලන තන්ත්‍රයට අනුගත වන ආකාරයෙන් ලංකාව පළාත් වශයෙන් හා නැවත කොරළ හා තුලාන වශයෙන් බෙදා ඇත. මහපොතාන කෝරළය යනු

එවන් පරිපලන ඒකකයකි. අස්පෘෂ උරුමය යනු භෞතික වශයෙන් ස්පර්ෂ කළ නොහැකි මිනිසාගේ හැඟීම් හා බද්ධ වන උරුමයයි. මේවා මිනිසා විසින් නිර්මාණය කරගත් නිසා සංස්කෘතික උරුමය ලෙස හඳුන්වයි. දත්ත එක් රැස් කිරීමේ දී මූලික වශයෙන් පුස්තකාල ගවේශණය තුළින් හා මූලාශ්‍රය අධ්‍යනය ඇසුරෙන් සිදු විය. එ මගින් මූලික දත්ත සපයා ගැනීමට හැකි විය. මෙම පර්යේෂණයේ දී ක්ෂේත්‍ර අධ්‍යනය මගින් දත්ත එක්රැස් කිරීම ප්‍රධාන වශයෙන් සිදු විය. ක්ෂේත්‍රයට ගොස් දල පර්යේෂණ ගැටළුවකට අනුව දත්ත එත් රැස් කිරීම සිදු විය. එහිදී විධිමත් ප්‍රශ්නාවලි යොදා ගැනීමෙන් තොරව අවශ්‍ය දත්ත ක්ෂේත්‍ර සටහන් පොතක නිවරදිව සටහන් කර ගැනීම මඟින් උරුම අංගයන් හඳුනාගැනීමෙන් පසුව ඒවාට අදාල දත්ත එත් රැස් කිරීම සිදු විය. මෙම කටයුතු වලට සම්බන්ධ වන පිරිස් අතරින් වයස අවු: 50 ට වැඩි පුද්ගලයන්ගෙන් දත්ත ලබා ගැනීම සිදු විය. දත්ත විශ්ලේශණයේ දී මානැවයන් පෙන්වා දී ඇති ආකාරයට එනම් 'හවුල් මංගල්ල' හා 'පවුල් මංගල්ල' ලෙස මෙම සාම්ප්‍රධායික පූජා වෙන් කරගැනීම සිදු විය. එමෙන් ම මෙම ප්‍රදේශයට ආවේණික දෙවිවරුන් හා එම දෙවිවරුන්ට පවත්වන පුද පූජා වෙන් කර ගැනීමෙන් පසු ඒවාට අදාල දත්ත පෙළ ගැස්වීම සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම ප්‍රදේශයේ පවත්වනු ලබන පුද පූජා අතරින් දෙවියන් මුල් කරගෙන පවත්වනු ලබන ප්‍රධාන අංග කිහිපයක් අධ්‍යනයට ලක් විය. ප්‍රාදේශීයව පවත්වන මෙම පූජා අංග කේ.බී මනැව විසින් නුවරකලාවියේ ජන මංගල්ල කෘතියේ 'ජන මංගල්ල' ලෙස හඳුන්වා ඇත. මෙහි දී මහපොතාන කොරළයට සුවිශේෂී වූ ජන ජීවිතය හා බැඳුන අභිචාර කිහිපයක් අධ්‍යනයට යොමු විය.

- කුඩා කතරගම දේවාල පෙරහැර
- මුට්ටි නැමීම
- කිරි ඉතිරවීමේ මංගල්ල
- හත් දෙනා දානය
- මඩුවේ කෝවිල් දානය
- දූගී දානය

මේවා ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ අධ්‍යනය කළ හැකි වේ. එනම් 'හවුල් මංගල්ල' හා 'පවුල් මංගල්ල' වශයෙනි. ගමේ පොදු කටයුතු අරබයා සියලුම ගැමියන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන ඒවා සහානුබද්ධ පූජා මංගල්ල' හෙවත් 'හවුල් මංගල්ල' ලෙසත් පවුලේ යම් ශාංතියක් පතා පවත්වනු ලබන ඒවා 'පුද්ගලයානුබද්ධ පූජා මංගල්ල' හෙවත් 'පවුල් ජන මංගල්ල' ලෙසත් හඳුන්වනු ලබයි.[7] මේ අතරින් කුඩාකතරගම දේවාල පෙරහැර, මුට්ටි නැමීම, කිරි ඉතිරවීම ආදිය සහානුබද්ධ පූජා මංගල්‍ය හෙවත් හවුල් මංගල්‍ය ලෙස හඳුනා ගත හැකි වේ.

- ජාතික සමගිය ආගමික සමගිය ඇති කිරීම
- නිසි කලට වැසි වස්සවා අස්වනු සරුසාර කර ගැනීම
- ප්‍රදේශයේ සමගිය පවත්වාගෙන යාම
- විනෝදාස්වාදය
- පැරණි චාරිත්‍ර පවත්වාගෙන යාම
- සාම්ප්‍රධායික කුල ක්‍රමය පවත්වාගෙන යාම

මේවා පැවැත්වීමේ අරමුණු විය.

මෙම උත්සව පැවැත්වීමෙ දි කුල වශයෙන් වෙන් වී සේවා සැපයිම සිදු කරයි. ඒ සඳහාම වෙන් වූ 'හිමිකාර ගම්' හා 'සේවා ගම්' ඇත. අවුරුදු පහකට වරක්, හතකට වරක්, ආදි වශයෙන්

[7] මානැව, කේ.බී. (2004) නුවරකලාවියේ ජන මංගල්ල. පිට xvi

මහපොතාන කෝරළයේ මෙම පුද පූජා උත්සව අදටත් පවත්වනු ලබයි. මෙම කාල වලදී ගැමියන් දර සෙවීමට කැලයට යාම, නිවෙස් වල පිටි කොටා කැවිලි පෙවිලි සකස් කිරීම, ආදියෙන් වැලකී සිටියි. කුඩා කතරගම දේවාල පෙරහැර කතරගම දෙවියන් මුල් කර ගනිමින් පවත්වනු ලබයි. කෝන්වැව කුඩා කතරගම දේවාලය කේන්ද්‍ර කරගෙන දින පහලොවක් පුරාවට පවත්වනු ලබන පෙරහැර දිය කැපීමෙන් අවසන් කරයි. මුට්ටි නැමීමේ මංගල්‍යය හෙවත් මුට්ටි නැමීමේ පෙරහැර අයියනායක දෙවියන් මුල් කර ගනිමින් සිදු කරයි. රාත්‍රියේ යහන් පේ කර කපුරාළ ආ වැඩූ පසු පසුදා පහන් වන තුරු නොනවත්වා සිදු කරන හේවිසි වාදනය මධ්‍යයේ දෙවියන් ලෙස පේ වී සිටින පිරිස් රංගනයේ යෙදෙයි. පසුදා පහන් වීමෙන් මුට්ටි තුන අතු තුනක් විහිදී ගිය ගසක මුනින් නැමීමෙන් මෙය අවසන් වේ. රැයක් පහන් වන තෙක් පවත්වන මෙම අවස්ථා වලට ගැමියන් මහත් වූ භක්තියෙන් සම්බන්ධ වෙති. සියලු දෙනා එකට හිඳ ආහාර පාන ගනියි. මෙම අංග ඉතා අලංකාරවත් මෙන් ම විනෝදකාමී ද වේ. මේවාට අදාල චාරිත්‍ර සාම්ප්‍රධායික වන අතර ඉමහත් භක්තියෙන් පේ වී අදටත් සිදු කරයි. මෙම ප්‍රදේශයේ කිරි ඉතිරවීම විශේෂයෙන් සිදු කරන්නේ පුල්ලයාර් දෙවියන් මුල් කරගෙනය. වැවේ, වෙලේ, ගමේ, පන්සලේ, ආදී සෑම ස්ථානයකම සිදු කරන සුභ කටයුත්තකට පෙර ගණදෙවියන්ට භාර වී ඒවා ඔප්පු කිරීම් වශයෙන් කිරි ඉතිරවීම සිදු කරයි. එමෙන් ම දීර්ගකාලීන ව පැවත එන සාම්ප්‍රධායික අංගයක් ලෙස ද මෙය විවිධ අවස්ථා වල සිදු කරයි. මෙය කුල භේදයකින් තොරව පාහේ සියලු දෙනා ආශීර්වාදය පතා සිදු කරන යටයුත්තකි.

හත්දෙනා දානය, මඩුවේ කෝවිල් දානය, දුගී දානය ආදිය පවුලේ යම් ශාංතියක් පතා පවත්වනු ලබන අතර ඒවා 'පුද්ගලයානුබද්ධ පූජා මංගල්‍ය' හෙවත් 'පවුල් ජන මංගල්ල' ලෙස හඳුන්වනු ලබයි. පවුලේ ගෘහ මූලිකයා හෝ පවුලේ වෙනත් අයෙකු මුල් වී සිදු කරනු ලබන මේවා වාර්ෂිකව සිදු කරනු ලබයි. හත් දෙනා දානය පවත්වනු ලබන්නේ පත්තිනි දේවතාවිය මුල් කරගෙනය. වැඩිවියට පත් නොවූ කාන්තාවන්ට දානය සඳහා ආරධනා කරනු ලබන අතර කරනු ලබයි. දුගී දානය පවත්වනු ලබන්නේ රදල කුලයේ නිවෙස් වල පමණි. මෙම උත්සවය සඳහා මහ දෙවියන් ලෙස හඳුන්වන කතරගම දෙවියන්ගේ තිරය නිවසට වැඩමවීම කළ යුතුවේ. කිරි ආහාර මෙන් ම බත් , වට්ටක්කා ව්‍යංජනය, තක්කාලි හොදි, අමුණකොල මැල්ලුම, දානය වශයෙන් ලබා දිය යුතු වේ. මෙහි විශේෂත්වය වන්නේ කොපමන පිරිසක් මේ සඳහා සහභාගි වූවත් සියලු දෙනාට දානය ලබා දිය යුතු වේ. මෙම යටයුතු අවසන් වන තුරු හක්ගෙඩිය පිඹීම සිදු කරයි. මඩුවේ කෝවිල් දානය ද පවුලේ කුඩා දරුවන්ගේ ආරක්ෂාව පතා සිදු කරන අතර ගමේ කුඩා දරුවන් එක් රැස් කර දානය පවත්වනු ලබයි.

කේ.බී මානෑව නුවරකලාවියේ ජන මංගල්ල කෘතියේ ද, අනුරින් ඉන්දිකා මෙනවිය කනදරා කෝරළයේ ජන ඇදහිලි හා විශ්වාස කෘතියේ ද, ප්‍රාදේශීයව පවත්වන අභිචාර පිළිබඳ සාකච්ඡා කර ඇත. එහි දී නුවරකලාවියට පොදු කිරි ඉතිරවීමේ මංගල්ල, මුට්ටි නැමීමේ මංගල්‍යය පිළිබඳ ප්‍රමාණාත්මක ලෙස විස්තර කර ඇති අතර මාගේ අධ්‍යනයට බඳුන් වූ අභිචාර හා මේවා අතර සමානතා මෙන්ම අසමානතාද දැකිය හැක. එමෙන්ම කුඩා කතරගම දේවාල පෙරහැර හත් දෙනා දානය, මඩුවේ කෝවිල් දානය, දුගී දානය ආදිය මෙම ප්‍රාදේශයට ම ආවේණික ඒවා ලෙසින් හඳුනා ගත හැකි වේ. කුල ක්‍රමය සමාජයෙන් පහ වී යාමත්, වර්තමාන තරුණ පිරිස් මෙම කටයුතු වලින් දුරස් වී සිටීමත්, මෙම සාම්ප්‍රධායික පුද පූජා

පිළිබඳ දැණුවත් පිරිස් සීමිත වීමත් නිසා මේවා පැවැත්වීම වර්තමානයේ අභියෝගයක් බවට පත්ව ඇත. ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂී වූ මෙම අභිචාර හිංදු ආගමේ බලපෑම ඇති ව සම්භවය ලබා ඇති අතර බෞද්ධ සම්ප්‍රධායන් හා මිශ්‍ර වෙමින් ප්‍රදේශයට ආවේණික ලෙස නිර්මාණය වී ඇත. උපහාසාත්මක නාට්‍යමය අවස්ථා, සම්ප්‍රධායික චාරිත්‍ර, ආදියෙන් පරිපූර්ණ මේවා ගැමි ජීවිතයේ කොටසක් බවට පත්ව ඇත. මහපොතාන කෝර්ළයේ අදටත් පවත්වන මෙම පූජා යාතු කර්ම ආදියෙන් ඔවුන් ලබන ආශිර්වාදය සියැසින්ම දැක ගැනීමට හැකි විය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ඉන්දිකා අනුරින් (2002), *කනදරා කෝර්ළයේ ජන ඇදහිලි හා විශ්වාස*, ඇස් ගොඩගේ සහ සහෝදරයො

චන්දන ඔරුක්මාන්කුලමේ (1997), *හුරුලු මංගල්‍යය*, තුසිත ප්‍රකාශන

මානැව කේ බී (2004), *නුවරකලාවියේ ජන මංගල්ල*, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ